SLGURU.LK

සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය I	කාලය Time	පැය 03

උපදෙස්

- **පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** සහ **උ** උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන අසා ඇති ප්‍රශ්නවලටද **ඌ** සහ **එ** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

(අ). බුදුහු ඔහු දැක මා එතනට යාමෙන් වන ප්‍රයෝජන කවරේ දෝහෝ යි පරීක්ෂා කරන සේක් මා එතනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවාගෙන කොටගත් අනිත් පින්කමක් නැතත් සිත පහදවාගත් පමණකින් මිය ගොසින් තවුතිසා දෙව්ලොව එක්සිය විසිගව්වක් විතර උස ඇති රන්විමනෙක උපද්දී, ඔහු පිරිවරා දෙවඟනෝ දහසක් දෙන පහළ වෙති. බමුණු මියගිය පුතු දවාපියා මළ පුතු අරබයා හඬමින් දවාපු සොහොනෙහි ඇවිද්දී. දෙව්ලොව උපන් මට්ටකුණ්ඩලී දෙව්පුත් ද තුන් ගව්වක් පමණ උස හා ගවුවක් විතර පලන් ඔටුන්න හා එක් ව සතරගවුවක් උස ඇති ව ගැල් සැටෙක පිරෙන ආභරණයෙන් සැරහුණු දහසක් දෙවඟනන් විසින් පිරිවරන ලද ඉතා ශෝභාමත් වූ ආත්මභවය දැක ''මේ දෙව්සැපත නිකම් හුන් පමණකින් ලද හැක්කේ නොවෙයි. එක්තරා පින් කමකින. කෙසේ වූ පින් කමෙක් දෝහෝ'' යි තමා කළ පින් සලකන්නේ ආසන්නකර්ම ව සිටි අනික් පින් කමක් නැති හෙයින් මා කෙරෙහි සිත පහදවාගත් පමණකින් නියාව දැන ''අනේ අදින්නපුබ්බක නම් බමුණු ඒ සා මහත් වස්තුව මඳ ව යෙයි යන මසුරු අදහසින් මට බෙහෙත් පමණකුත් නොකරවා මියන්ට අත්හැර දැන් ආදාහනභූමියට ගොසින් වසාලු කඩරෙද්දට ලොභයෙන් හඬන්නා සේ හඬයි. හඬන්නහු දිවන්නන් ලුහුබඳවන්නා සේ තරයේ ම හඬාපුවමනා වේ දැ''යි පියා කෙරෙහි **මුසුප්පුවෙන්** මට්ටකුණ්ඩලී ලෙසින් අවුත් සොහොන් බිමට නුදුරු තැනක සිට හඬයි.

(i). ශෝභමත් ආත්මභවය දැක තමා කළ පින් පිළිබඳව විමසන්නේ කවුද ?

(ii). බමුණා හඬා වැලපෙන්නේ ඇයි ?

(iii). 'හඬන්නහු දිවන්නන් ලුහුබඳවන්නා සේ තරයේම හඬාපුවමනා වේ ද'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv). 'මුසුප්පුවෙන්' වචනයට කෙටි විවරණ සපයන්න.

SLGURU.LK
For Educational Purpose Only

(ල.1x4)

SLGURU.LK

(ආ). කපිල වස්තු පුරයෙහි සුද්ධෝදන රජ්ජුරුවන් මල් අමිතෝදන නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ අගමෙහෙසින් බිසෝ වූ සඳ නම් දේවීන් වැදූ දරුවෝ මහානාමය, අනුරුද්ධය'යි පුතුන් දෙදෙනෙකු හා රෝහිණී නම් දියණි කෙනකුන් හා තුන්දෙනෙක් වූහ. එයින් අනුරුද්ධ නම් කුමාරයෝ ඉතා මහත් වූ පින් ඇති කෙනෙක. ඔවුන් සත් අට හැවිරිදි කල රජකුමරුවන් තුන්දෙනකු හා සමඟ පැරදී කෙනෙක් ''කැවුම් තලි, දෙම්හ'යි ගිවිස ගුළ කෙළි කෙළිනාවු ය. එ කල අනුරුද්ධ කුමාරයෝ පැරද ගියහ. සෙසු රජකුමාරුවෝ ''කැවුම්තලියක් දුනොත් මුත් නොකෙළුම්හ'යි කීය.

එවෙලෙහි අනුරුද්ධ කුමාරයෝ තමන් පැරදි බව මෑණියන්ට කිය යවා කැවුම් තලියක් ගෙන්වා දී මෙසේ ම තුන් වාරයෙක පැරදී තුන් වාරයක් කැවුම් ගෙන්වා දී, සතරවන වාරයෙහිත් පැරද ''කැවුම් තලියක් එවන්නේ ය'යි මෑණියන්ට කියා යවූහ. බිසොවු තුන්වාරයෙක කැවුම් යවා කුසී ව ''දරුවන් පැරදි පැරදි යේ මම කැවුම් තලි යවාගත නොහෙමි. ඉතිකින් ගෙයි කැවුම් නැත'යි කියා යවුවාහු ය. අනුරුද්ධ කුමාරයෝ කැවුම් නැතැ යි කියා යවු බස් අසා තමන් උපන් තැන් පටන් නැතැයි යන බසක් නො ඇසූ විරූ හෙයින් නැතැයි යන බසෙහි අර්ථ නො දැන නැති පූ ය යි යන **පූ** ජාතියෙක් ඇතිවනැ'යි සිතා ඒ නැති පූ පිහා එවන්නේ ය'යි කියා යවුවාහු ය.

(i). අමිතෝදන ශාක්‍ය රජු නැකමින් සිදුහත් බෝසතාණන්ගේ කවුද ?

(ii). කුමාරවරු සෙල්ලම් කිරීම සඳහා වූ පොරොන්දුව කුමක්ද ?

(iii). දරුවන් පැරදි පැරදි යේ මම කැවුම් තලි යවාගත නොහෙමි' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv). 'පූ' යන්නට කෙටි විවරණ සපයන්න.

(ල.1x4)

(ඉ). සැඟවී සිටි රජ කිඳුරා මළේමනැයි හෙලින් බැස තී හඬන්ට කාරණා කවරේදැයි මම තී **පාදපරිචාරිකා** කොට සොළොස් දහසක් පුරඟනාවන්ට අගමෙහෙසුන් කෙරෙමියි යන ආකාර දැන්වීය. කින්නරාඛගනාද ඔහු දැක මේ සොරහු විසින් විදිනා ලද්දේ යයි භය සෝක දෙකින් වෙවුලමින් දිවගෙන ගොස් පර්වත මුදුනට නැගී රජහට අවන්ට පටන් ගත්හ. ඒ කෙසේද යත් ? යම් රජෙක් මාගේ කැමති සමණන් කිසිලි මැද විදපීද ඒ තෙම චිත්තා ශරවේගයෙන් තැති ගත්තේ විසංඥව බිම වැද හොත්තේය. අනේ මා දිවගෙන ගොස් ගල් මුදුනෙක ලා මේ සා දුඃඛයක් උපදවන ලද පාපිෂ්ට වූ තා වැනි ද්‍රෝහී මාගේ ස්වාමි පුත්‍රයාණන් මා උදෙසා මැරී නම් මාගේ ස්වාමි පුත්‍රයාට පත් මරණ දුක්ඛය තට වේවයි මට පැමිණියාවු මේ සෝකය තාගේ අඹුවන්ට ද වේවයි, තවද පවිටි වූ තාගේ මව්ද තා නොදැක සොහොන් වදිවයි. තවද දුෂ්ට වූ මහරජ තාගේ ප්‍රජාපතී තොම තමන් දරුවන් නොදැක නිරාවදිවයි යනාදීන් ඇවිලි අඬන්ට පටන් ගත්හ.

(i). මෙහි 'තී' යනු කවුද ?

(ii). රජු පර්වතයෙන් බැසීමට හේතුව කුමක්ද ?

(iii). ''භය සෝක දෙකින් වෙවුලමින් දිවගෙන ගොස් පර්වත මුදුනට නැගී රජහට අවන්ට පටන් ගත්හ' මෙම කොටස ලිහිල් බසින් ලියන්න.

(iv). 'පාද පරිචාරිකා' යන්නට කෙටි විවරණ සපයන්න.

(ල.1x4)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(ඊ). එබැවින් යම්කිසි උපායකින් ඈ මරවාපුව මැනැවැයි සිතා ඇතරුවන් කැඳවා ඔවුන්ට අත්ලස් දී කියන්නාහු ''එම්බල සබ්දිනි, මොළ ඇතකු රා පොවා මත් කරවා ඔහු ලවා ස්වර්ණතිලකාව මරවාපියව'' යි කීහ. ඇතරුවෝ ද යහපතැයි ගිවිස්සාහ. ඉක්බිති ඒ රජකුමරුවෝ හැමදෙන ම රාජාඩගණයෙහි රැස්ව හිඳ''අපගේ ආචාරින් වහන්සේ දක්නා කැමැත්තම්හ'' යි දූතයකු යවූහ. එකල ඒ දූතයාගේ බස් අසා බමුණාණන් අවුත් උන් කල්හි කලට සුදුසු වූ පිළිසඳර කථාකොට ඉක්බිති ''ආචාරීන් වහන්ස, නුඹවහන්සේගේ භාර්‍ය්‍ය වූ ස්වර්ණතිලකාවන් දක්නා කැමැත්තම්හ''යි කීහ. එතෙපුල් අසා බමුණාණෝ ''ස්වර්ණතිලකාවන් කැඳවාගෙන එව''යි මිනිසුන් යවූහ. ඒ ගිය මනුෂ්‍යයන් ස්වර්ණතිලකාවන් කැඳවාගෙන විථීමධ්‍යයට පැමිණි කල්හි මද නැඟී සිටි මොළ ඇතකු රා පොවා මත් කරනා ඇත් කොහොලින් ඇන කුප්පවා ඉදිරියට ලුහුබඳවාලූහ. එකල්හි රා බී මත් ව කෝපයෙන් සොඬ ගෙන බිම පහරමින් මහත් වූ කුඤ්චනාදයෙන් දසදිග් පුරමින් ඒ ඒ අත මිනිසුන් ලුහුබඳවමින් සෙණ පහරන සේ දිව අවුත් වන්නාවු එ ඇත්තෙම ස්වර්ණතිලකාව දැක එකෙණෙහි උපන්නාවු ස්නේහයෙන් සොඬින් ගෙන ඔසවා තමාගේ කුඹමත්තෙහි තබා ගත. එපවත් දැක රජකුමරුවෝ නොසතුටු ව එපරිද්දෙන් ස්වර්ණතිලකාව මරා ගත නොහැකි හෙයින් දෙවන දවස් මිනිසුන් යවා රාත්‍රීභාගයෙහි මරවාපීහ. එකල්හි ඒ උද්දාල බ්‍රාහ්මණයා ද ''මෙබඳු ස්ත්‍රීරත්නයෙකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ''යි මහත් වූ ශෝකයෙන් නොයෙක් **ප්‍රලාප** කිය කිය හඬමින් රාජාඩගණයෙහි දරසෑයක් බඳවා ගිනි වැද මළේය.

(i). ස්වර්ණතිලකාව මරුමුවට පත්කිරීමට සිසු පිරිස යෙදූ උපාය කුමක්ද ?

(ii). ස්වර්ණතිලකා දුටු මොළ ඇතා කුමක් කළේ ද ?

(iii). '' මද නැඟී සිටි මොළ ඇතකු රා පොවා මත් කරවා ඇත් කොහොලින් ඇන කුප්පවා ඉදිරියට ලුහුබඳවාලූය...'' මෙම කොටස ලිහිල් බසින් ලියන්න.

(iv). 'ප්‍රලාප' යන්නට කෙටි විවරණ සපයන්න.

(ල.1x4)

(උ). රන් රසු දැල් ගිගිළී
රන්දද පෙළින් වූ හෙළී
එනුවර තුර බැබළී
දුටහ කෙළනා මහත් සැණකෙළී

සදවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹ තුරු
තබවා **පුන් කුඹු** විසිතුරු

(i). ඒ නගරය තුළ නාද නගන්නේ මොනවාද ?

(ii). නිවෙස් ඉදිරිපස තබා ඇති සැරසිල්ලක් ලියා දක්වන්න.

(iii). ''සදවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු...''ලිහිල් බසින් ලියන්න.

(iv). 'පුන්කුඹු' යන්නට කෙටි විවරණ සපයන්න.

(ල.1x4)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(උ). පහත සඳහන් උද්ධෘත අතරින් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i). ''මා දිවි හිමියෙන් හඬා ඇවිදතත් ඒ උන් දක්නට නැත.''

(ii). ''නොසලකා වරදවා කියාපීම්, මා කීයේ කිමෙක් දෝ හෝ''

(iii). ''නුඹ වහන්සේ එක් වේලේ වළඳති යනු අසා තුමූද එක භක්තියෙන් යැපෙන්නාහ.''

(iv). ''චණ්ඩාල කෙලි නම් තෙපිම යැ''

(v). ''මම මැරුණොත් දරු පැටව් ටික බලාගන්න.''

(vi). ''අම්මා, උඹ ඉතින් යන දිහාවක පලයන්...''

(vii). ''කොතෙක් කල් ඉවසාගෙන සිටිය හැකිද ?''

(ල.3x4=12)

(එ). පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

පැසුණු පැන - පී.බී. අල්විස් පෙරේරා

මල්වල පාට අම්මේ, කවුරුද ගෑවේ
දලු අතු පැළි ඒවා කොහොම ද ආවේ
මෙතරම් කැසුම ඇයි කහඹිලියා බූවේ
නිදිකුම්බා කොළේ මොකට ද නිදි යෑවේ

පවතී අඬනහිරියා මල්වල සද්දේ
කෝඳුරු රංචු අට්ටික්කා ගෙඩි මැද්දේ
කජු ඇට පුහුලමේ යටි පැත්තෙහි පැද්දේ
අම්මේ කළේ මේවා කවුරු ද බැද්දේ

ලස්සන රෝසමල් පඳුරට මොට ද කටු
කුමට ද බාඳුරා මල් කොකුවලට ගොටු
කජු ලුනුමිදෙලි ගස්වල මේ ඇලෙන හොටු
ගෑවේ කවුද මට කිව මැන කෙනෙකු දුටු

කොළයෙන් අක්කපානා මුල් අදිනු පෙනේ
කෝමාරිකා මද සීතල මොක ද අනේ
තුත්තිරි කරල්හැබ ඇට මගෙ ඇඳුම් කොනේ
තැවරෙයි මෙවැනි ගති කොහොම ද පුරුදු වුණේ

කවුරු ද කුරුම්බා ඇතුළට දිය දෙන්නේ
ඇයි මේ වරා මලු සුළඟට ඉගිළෙන්නේ
මල් නැහැ දිඹුල් ගස්වල මෙලෙසින් වන්නේ
කොහොම ද කියා අම්මා නොමැති ද දන්නේ

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සමහර මල් තිබේ ලස්සන එමට ඇත
එනමුදු සුවය නම් ගැවුණු තැනක නැත
සමහර මලක තනි සුදු මැලි පැහැය ගත
තිබුණත් සුවඳ පිනවයි දුටු අයගෙ සිත

සුදු පාටක් තිබේ දලුවල මුස්සැන්න
නා දලු කුරුඳු දලු රත් පැහැ පවතින්න
මදු දලු බුලත් දලු කොළ පාටින් එන්න
හැඳුවේ කවුද මට ඕනෑ දැන ගන්න

කළු මැදිරිය කළුය, ඇට්ටේරිය සුදු වේ
කොස් කහ, පතඟි රතු, එක කැලයක පොදුවේ
හටගත් ලී මෙසේ නෙක පැහැයට බෙදුවේ
අම්මේ කවුද පවසනු මැන පින් සිදු වේ

ලෙලි කටු පැඟිරි කෙඳි සහිත ව හට ගත්තයි
පැණි රහ කහට රහ පල ඇති බව ඇත්තයි
සමහර ගෙඩි ඇඹුල් සමහර ගෙඩි තිත්තයි
ඇයි මේ වෙනස අම්මා විමසිය යුත්තයි

(ල.12)

02. අවස්ථාවට ගැලපෙන උපමා භාවිතා කිරීම මගින් සජීවී බස්වහරක් ඉදිරිපත් කිරීමට සද්ධර්මරත්නාවලී කතුවරයාට හැකිවී තිබේ. නිර්දිෂ්ට කතාවක් ඇසුරින් මෙම කියමන විමසන්න.

(ල.15)

නැතහොත්

පතිව්‍රතා ධර්මය රැකීම යහපත් කුටුම්බ ජීවිතයකට මඟ පාදන ආකාරය නිර්දිෂ්ට ජාතක කතා ඇසුරින් සාකච්ඡා කරන්න.

(ල.15)

03. අ. දඹදෙණි යුගය සිංහල ගද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වන්නේ ඇයි දැයි පහදන්න.

(ල.07)

ආ. තත්කාලීන සමාජ තොරතුරු අනාවරණය කරගත හැකි විශිෂ්ට කෘතියක් ලෙස පූජාවලිය හඳුනා ගත හැකිය. විමසන්න

(ල.08)

නැතහොත්

ආ. කළ පින් පව් දෙක මතු භවය තුළ දී විපාක දෙන ආකාරය ස්වර්ණතිලකා වස්තුවෙන් පැහැදිලි වෙයි. විමසන්න.

(ල.08)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

04. අවට පරිසරයෙන් අපූරු කවි සිතුවිලි ප්‍රකට කිරීමට ගුත්තිල කවියා සමත් වී තිබේ. විමසන්න.

(ල.15)

05. බැද්දේගම නවකතාවෙහි පළමු පරිච්ඡේදය නවකතාව පිළිබඳව මනා අවබෝධයක් පාඨකයා වෙත ලබාදෙයි. විමසන්න.

(ල.15)

06. කෙටිකතාව යන්න හඳුන්වා කෙටිකතාවේ 'නම', එහි සාර්ථකත්වයට කෙතෙක් ඉවහල්වනවාද ? යන්න නිර්දිෂ්ට කෙටිකතා තුනක්වත් ඇසුරින් පහදන්න.

(ල.15)

07. දේශාභිමානය පමණක් නොව ස්වභාවික පරිසරය ද කොළඹ වැඩිහිටි තරංගයට තේමා වී තිබේ. නිර්දිෂ්ට පද්‍ය ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න.

(ල.15)

08. පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයෙහි පළමු අංකය මගින් බෞද්ධ දර්ශනයේ එන මූලික සංකල්ප හඳුන්වා දෙයි. විමසන්න.

(ල.15)

SLGURU.LK
For Educational Purpose Only

“The only person who is educated is the one who has learned how to learn and change.” — Carl Rogers

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade: 12	විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය - II	කාලය Time: පැය 03

නම : .....

උපදෙස්

★ I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2,3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

★ I ප්‍රශ්නයේ ඇති **සියලුම** අනුකොටස් වලට මේ **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

★ I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා, එයට හිමි අංකය වරහන තුළ ලියන්න

1.1 අඝෝෂ අල්පප්‍රාණාක්ෂර ලෙස හඳුන්වන්නේ මින් කවරක් ද?

1. ඝ , ඣ , ඨ , ධ , භ
2. ය , ර , ල , ව
3. ක , ච , ට , ත , ප
4. ශ , ෂ , ස , හ
5. ත , ථ , ද , ධ , න (.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. කුළය , දෘෂ්ඨි , විශ්මය , මොනරා , ශීඝ්‍ර
2. කුලය , දෘෂ්ටි , විශ්මය , මොනරා , සීඝ්‍ර
3. කුළය , දෘෂ්ඨි , විස්මය , මොනරා , ශීඝ්‍ර
4. කුලය , දෘෂ්ටි , විස්මය , මොනරා , ශීඝ්‍ර
5. කුලය , දෘෂ්ටි , විශ්මය , මොණරා , ෂීඝ්‍ර (.....)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. මැල්සිරිපුර , ඉබ්බාගමුව , දඹුල්ල , හබරණ
2. අනුරාධපුර , ආනමඩුව , ගම්පහ , ඉංගිරිය
3. මිනුවන්ගොඩ , ජා ඇල , ඒකල , හුණුමුල්ල
4. පොළොන්නරුව , මහියංගනය , දිඹුලාගල , හබරණ
5. අම්පාර , කුරුණෑගල , බලන්ගොඩ , මහනුවර (.....)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. 'ය' අකුර සමග යංශය බැඳී ඇති විට යංශය මත රේපය යෙදිය නොහැකි ය.
2. හල් අකුරකට පසුව යෙදෙන 'ය' කාරය වෙනුවට 'ඍ' යෙදේ.
3. යංශය යෙදුනු පසුව පෙර අකුරේ හල් ස්වරූපය ඉවත් නොවේ.
4. 'ර' කාරයට පසුව යංශය යෙදේ.
5. යංශය යෙදීමෙන් පසුව අකුරේ හල් ස්වරූපය ඉවත් වේ. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. සදහම් චාරිත්‍ර, සොදුරු සන්ධ්‍යාව , සිරිපා ලාංඡනය , මිනිස් ශරීරය
2. අෂ්ටාංග ශීලය , පූර්ණ ඝටය , උද්‍යාන භූමිය , දුට්ඨ ගාමිණී
3. පරිත්‍රාණ දෙසුම , මැදුම් පිළිවෙත , විසිතුරු දසුන , අටසිල්
4. දළදා මැදුර , විමසුම් ඇස , ඉදුනිල් මිණ , රන් ආභරණ
5. ශක්‍ර දිව්‍යරාජ , සූර්ය මණ්ඩල , චන්ද්‍ර බිම්බ , ප්‍රාචීන බස (.....)

1.6 **තත්සම පද** පමණක් යෙදී ඇති වරණය කුමක් ද?

1. පැදකුණු , ගදඹ , අබිසෙස් , පෙර
2. නිරායුධ , රජ , තෑග්ග , උද්‍යානය
3. දෙසුම , වර්ෂාව , සුගන්ධ , කුටිය
4. දුට්ඨ ගාමිණී , දන්ත ධාතු , ප්‍රසව , බිම
5. පෞරුස්‍ය , පශ්චාත් , නූතන , විදග්ධ මණ්ඩලය (.....)

1.7 තත්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. පවන , මාත්‍රා , තෑගි , ලෙව්
2. වියන් , කව්ලැකි , පහන් , නයු
3. තියුණු , ගොයුම් , ආදර , සියුම්
4. වධක , නැව් , සැත , වෙළුම
5. වුවන , ලවන , පමණ , ජරා (.....)

1.8 අව්‍ය , අන්‍යාර්ථ , විශේෂණ හා දකාරාර්ථ සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. දසබල , අසුර , පස්පියුම් , මුතුමැණික්
2. පසැස් , ලඹසවන් , දසබල , ඉරහඳ
3. ගුරුපඬුරු , කුදිටු , තිනෙත් , අඹුදරු
4. කුකවි , සියපත , රත්පියුම් , ගස්වැල්
5. අනග , සුකුමාර , වතපියුම් , ගීනැටුම් (.....)

1.9 කෘදන්තයක් **<u>නොවන</u>** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. දිවීම් , සෙවීම් , සේදීම් , රැකීම්
2. නැටුම් , ගැයුම් , පිනුම් , වැයුම්
3. දිවිලි , පැනිලි , ගෙරවිලි , එරවිලි
4. සේදෙන , පේවෙන , ගොරවන , බැබළෙන
5. බැලූ , නැටූ , වැයූ , පිසූ (.....)

1.10 පහත දැක්වෙන උද්ධෘතවල තද කළු අකුරින් මුද්‍රිත පද ඇතුළත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ) ''**කියමින්** රස ගී සින්දු''
ආ) ''කිරි **ඉතිරේවා**! නව වසරේ''
ඇ) ''**කියන්න** සුළගේ ඔබ කොයි සිටදෝ එන්නේ''
ඈ) ''පයින් මැ **ගොස්** ඇවිද වටේ''

1. විධි ක්‍රියා , පූර්ව ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , මිශ්‍ර ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , විධි ක්‍රියා , පූර්ව ක්‍රියා
4. ආශිර්වාද ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා
5. පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , ආශිර්වාද ක්‍රියා , විධි ක්‍රියා (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

1.11 තද්ධිතයක් **<u>නොවන</u>** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. අසිරිමත් , විද්‍යාඥ , ඇමෙරිකානු , නැවියා
2. අහළ , සෙල්මුවා , දක්ෂතර , පැනිති
3. ධීමත් , මෘදුතර , කොබ , ජන්මය
4. නිපුණතා , තෙරණුවෝ , භාග්‍යවත් , ඥානවන්ත
5. රැටියා , රජතමය , ඉසුරුමත් , පුණ්‍යවන්ත (.....)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. අපගමනය , නික්ලේශ , අවියක් , උපහාසය
2. අතිරස , කුකවි , සුගුණ , දුදන
3. අධිපති , විගමන , දුර්ජන , ප්‍රතිපක්ෂ
4. අතිධාවන , කුරවි , සන්දර්ශන , අභිමාන
5. ආයාචනා , වියෝග , කුමන්ත්‍රණ , අභියෝග (.....)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. වූකලී , මෙන් , අයුරු , අග
2. හෝ , අනේ , තුරු , මිස
3. සඳහා , පමණ , මන්ද , නිතොර
4. යළි , දක්වා , කිම , වස්
5. උදෙසා , එපා , නිති , හෙවත් (.....)

1.14 '' වලා පෙළින් සැදි **මුතුකුඩයක්** යට
තරග නඟා ලෙළදෙන මුහුදේ
සිඟිති දොරක් ඇති පොඩි බෙලි **කටුවෙක**
මුතු ඇටයක් සීරුවෙන් සැදේ ''

යන්නෙහි තද කළු අකුරින් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංග වලට ද?

1. සමාස , සන්ධි , තද්ධිත
2. සන්ධි , සමාස , තද්ධිත
3. සමාස , තද්ධිත , සන්ධි
4. සන්ධි , තද්ධිත , සමාස
5. තද්ධිත , සමාස , සන්ධි (.....)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කෙරෙන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. නටුවෝ ය , බටුවෝ ය , දුටුවෝ ය , ගැටුණෝ ය
2. රැකුණහ , කැපුණහ , දැපුණහ , විකුණුහ
3. මැරෙයි , ගැයෙයි , හැඬෙයි , වෙයි
4. වස්සයි , නටවයි , නංවයි , යවයි
5. නටා , ගයා , වයා , ගයමින් (.....)

1.16 සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1. දුගඳ , ප්‍රබල , නිසල , විදේශ
2. මවුපිය , ඉරහඳ , ඇළදොළ , ගස්වැල්
3. සුදුරෙද්ද , නිල්අහස , දසසිල් , ත්‍රිකෝණ
4. බුදුගුණ , ළමාපොත , මවුකිරි , එළුමස්
5. දසබල , තිනෙත් , මලවි , පිනැති (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1. දකුණත , යනෙන , දිනිඳු , සුරන
2. අස්සන , පිළියම් , ගෙත්තම් , සිත්තම්
3. ළිංමැඩි , මංමුලා , හික්කඩුව , වියළිඟුරු
4. මහණුවම් , දුප්පත් , අග්ගළා , චූලෝදර
5. පණැති , නිරිඳු , දකුණැස , ගුරුතුමා (.....)

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන වරණය කුමක් ද?

1. කැපීම් , කෙටිලි , දිවීම් , ඉවීම්
2. වනමල් , බුදුගුණ , රියහිමි , සුරතුර
3. ගගණන් , කැනිති , මිනිසි , පින්වත්
4. මතැත් , නිලඹර , උපනුපන් , දණින්
5. විතර , කරමි , පමණ , නැවත , වැලි (.....)

1.19 ව්‍යාකරණානුකූලව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

1. ටික දෙනෙක් අවුරුදු කුමරිය තරගයට ඉදිරිපත් වෙති.
2. ක්‍රිකට් කණ්ඩායමෙන් එක් අයෙකු ඉවත් වෙයි.
3. සියොත් කැල අහසේ පියඹයි.
4. තරුපෙළ අහසෙහි බබළති.
5. තෙරණුවෝ බණ දෙසයි. (.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය තෝරන්න.

1. ඔක්කොම දරුවෝ පාසල් ඇවිත් හිටියා.
2. ඔයාට දැන් හොඳ ද?
3. ත්‍රස්තවාදියෝ බෝම්බ ගහයි කියල අපිට බයයි.
4. අපි වෙනුවෙන් අපි එක්කහු වෙන්න ඕනෑ.
5. ගසුත් වැලුත් මල් පුබුදු කරයි. (.....)

II කොටස

★ මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

02. අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

චරිතයක් කේන්ද්‍ර කොටගෙන පුද්ගලයෙකුගේ විසුරුණු විඥානය හා සවිඥානය අතර සංඝටනය නිරූපණය කිරීම අධියථාර්ථවාදී සාහිත්‍යයික ලක්ෂණයකි. සෑම පුද්ගලයෙකු ම සමාජ සත්වයකු වන බැවින් සමාජය පිළිබඳ දැනුම, අත්දැකීම් අවලෝකනය අනුසාරයෙන් ගොඩ නැගුණු පුළුල් සමාජ පරිසරයක් පවතී. එය උගත්කම, අධ්‍යාපනය, ජීවනෝපාය ආදී පුද්ගල ක්‍රියාකාරීත්වයෙහි විවිධත්වය මත වෙනස් විය හැකිය. අඩු වැඩි විය හැකි ය. පුද්ගලයා වටා භ්‍රමණය වන සමාජ, දේශපාලන හා සංස්කෘතික තලයන්හී සංකේන්ද්‍රණය වන පුද්ගල අන්තර් බාහිර චලනයන්ගේ ද සුසංයෝග, සංඝටක, පරස්පරතා, ප්‍රතිවිරෝධතා යනාදිය මෙබඳු වූ සාහිත්‍ය කෘතිවල නිරූපණය විය හැකිය. එම නිසා සම්මත සාහිත්‍යයික සිද්ධාන්තවලට අනුකූල වූ සාහිත්‍ය කෘතියෙන් ප්‍රකට වන සමාජය අරභයා විවරණයක් අපේක්ෂා කළ නොහැකි ය. යථාර්ථය ඉක්මවා සාහිත්‍ය කෘතියක සමාජ නිරූපණය යනු අර්ථහීන සිද්ධාන්තයකි. මෙබඳු අධියථාර්ථවාදී හෝ මායා යථාර්ථවාදී සාහිත්‍ය කෘතිවලින් සමාජ ප්‍රපංචයන් ඉක්මවා ගිය සත්‍ය යථාර්ථය සියලු සීමා බන්ධන හා වැට කඩොලු ඉක්මවා ගොස් ප්‍රතිනිර්මාණය වේ.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(i) මේ ඡේදයට අනුව ''අධිරාජ්‍යවාදී සාහිත්‍යයික ලක්ෂණය'' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
(ii) මේ ඡේදයට අනුව සමාජගත ව ජීවත්වීම තුළින් පුද්ගලයා ලබන සම්පත් ලෙස ඔබ දකින්නේ මොනවාද?
(iii) පුද්ගලයා සමාජය පිළිබඳ ලබන දැනුමෙහි විවිධත්වය පළ කිරීමට බලපාන සාධක දෙකක් නම් කරන්න.
(iv) සමාජ මනස විවරණය කරන සාහිත්‍ය කෘතිවල නිරූපණය විය හැකි කරුණු දක්වන්න.
(v) සාහිත්‍ය කෘතියක් ''අර්ථහීන සිද්ධාන්තයක්'' බවට පත් වන්නේ කෙසේ ද?
(vi) මෙහි දැක්වෙන සාහිත්‍ය කෘති දෙවර්ගය කුමක්ද?

(ල. 12)

ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

''භාෂාවෙන් නොහොත් තම නිර්මාණය සඳහා භාවිත කෙරෙන වචන සංයෝග මගින් පාඨකයාගේ මනසෙහි චිත්‍රයක් මැවීම නිර්මාණ ලේඛකයාගේ කාර්යය වන්නේ ය. සංකල්ප රූපය නම් වචන මගින් ඉදිරිපත් කෙරෙන වාග් චිත්‍රය යි. එය වාග් චිත්‍රයක් වන්නේ වචන ආශ්‍රයෙන් මවන චිත්‍රයක් නිසා ය. සංකල්ප රූප කාව්‍යයේ අත්‍යවශ්‍ය අංගයක් බව පුරාණයේ පටන් සලකන ලදි. කාව්‍යාලංකාර භාවිත කෙරෙන්නේ මේ අරමුණු ඇතිව ය. උපමා, රූපක, දීපක, යමක යන අලංකාර සතරක් ගැන භරත මුනීඳු සඳහන් කළහ. රූපකාර්ථ සහිත පද යෝජනය සාර්ථක කාව්‍යයේ ලක්ෂණයක් ලෙස ඇරිස්ටෝටල් සඳහන් කර ඇත. ජපන් හයිකු කාව්‍යයේ දී ද සංකල්ප රූප කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. සාහිත්‍ය නිර්මාණයක භාවිත කෙරෙන සෑම ශිල්ප විධියකම මූලික අරමුණ වන්නේ සංකල්ප රූපයක් ජනිත කිරීමය. කාව්‍යය, නවකතාව ආදී හැම සාහිත්‍ය නිර්මාණයක ම සංකල්ප රූප හෙවත් වාග් චිත්‍ර දක්නට ලැබේ. සාහිත්‍ය කෘතිය සංකල්ප රූප සංයෝජනය විය හැකිය. සමස්ත කෘතිය එකම සංකල්ප රූපයක් ද විය හැකිය.

''සංකල්ප රූප යනු කුමක්ද? පාඨකයාගේ පසිඳුරන්ගේ මාර්ගයෙන් ඔහුගේ මනසට පිවිස, ඔහු තුළ භාව ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් වාග් චිත්‍රය සංකල්ප රූප ලෙස හැඳින්විය හැකිය.'' මීට ප්‍රධාන වශයෙන් ම ඇතුළු වන්නේ උපමා හා රූපක ය. සංකල්ප රූප ගැන විමසීමේ දී බොහෝ විට අප සිතට නැගෙන්නේ චක්ෂුද්වාරගත රූප පමණකි. ඊට ප්‍රධාන හේතුව මේ ගණයට අයත් වන සංකල්ප රූප සෙසු ඒවාට වඩා බෙහෙවින් සුලබ වන හෙයිනි.

(ල. 13)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණාකූලව ලියන්න.

(i) ආගමික උත්සව වාණිජකරණය වීම වළකා ගනිමු.
(ii) සැබෑ ගීත සාහිත්‍ය රසාස්වාදයෙන් බැහැර වන වත්මන් තරුණ පරපුර
(iii) තරගකාරී ජීවන රටාව හේතුවෙන් අභියෝගයට ලක්වන මානව සබඳතා
(iv) සමාජ වෙබ් අඩවි මගින් ශ්‍රී ලංකාවේ තරුණ පරපුර කෙරෙහි ඇති වන බලපෑම
(v) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි පෞද්ගලික විශ්වවිද්‍යාලවල බලපෑම

(ල. 25)

04. අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) පොත් කියවන පාඨකයන් සහෘදයන් වෙති.
(ii) පදිකයෝ පාරේ දකුණින් යා යුතු ය.
(iii) විදුහල්පතිතුමා විසින් දෙමාපියෝ පිළිගනු ලැබුවෝ ය.
(iv) ක්‍රීඩා කණ්ඩායමෙන් එක් අයෙක් ඉල්ලා අස්වෙති.
(v) ඇමතිවරිය නව ලේකම්වරිය පත් කළා ය.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

අ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) විද්‍යාචක්‍රවර්තීහු බුත්සරණ ලියූහ.

(ii) නවකතාකරුවෝ පාඨකයන් පිනවති.

(iii) ආණ්ඩුකාරවරයා ඇමතිවරියක පත් කරයි.

(iv) ආදි ශිෂ්‍යයෝ මහත් හරසරින් මා පිළිගත්හ.

(v) මම ආදරයෙන් ආදී ශිෂ්‍යයන් ඇමතීමි.

ඉ) නිවැරදි වාක්‍යයන් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන තුළින් තෝරා ලියන්න.

(i) සැහැල්ලු හදවත් (ඇත්තෝ / ඇත්තන්) නිතර (සිනාසෙයි ලු / සිනාසෙත් ලු)

(ii) (කවියෝ / කවියන්) කවි (ලියයි / ලියත්) නම් රට සැපවත් වේ.

(iii) (වියත්තු / වියතුන්) රටට කරන සේවය (අපි / අප) අගය කළ මැනවි.

(iv) අම්මා (දරුවෝ / දරුවන්) සමඟ පොත් ප්‍රදර්ශනයට (ගියාය / ගියහ)

(v) (සහාතොමෝ / සහාතෙමේ) සතුටින් විසිර (ගියාය / ලියහ)

(ල. 15)

05. පහත දැක්වෙන වාක්‍ය වල **තද කළු අකුරෙන් මුද්‍රිත පදවල** ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) අන්න **<u>බලන්</u>** සඳ **<u>රන්තැටියෙන්</u>** සුදු සීත ගඟුල් **<u>ගලනා</u>**
(බලන් - ක්‍රියා , රන්තැටියෙන් - සමාස , ගලනා - කෘදන්ත)

(ii) මිහිරි **<u>මව්කිරි</u>** **<u>වගේ</u>** පොවන්නෙමි **<u>නුඹලාට</u>**
(මව්කිරි - විභක්ති , වගේ - නිපාත , නුඹලාට - විභක්ති)

(iii) **<u>මෙහෙකරුවා</u>** **<u>රන් රිදී</u>** ආභරණ ගෙන **<u>නිවසින්</u>** පැන ගියේ ය.
(මෙහෙකරුවා - සමාස , රන්රිදී - සමාස , නිවසින් - විභක්ති)

(iv) **<u>කොස්දෙල්</u>** **<u>සහ</u>** **<u>ඉන්නල</u>** ද වතුවල වගා කෙරේ.
(කොස්දෙල් - සමාස , සහ - නිපාත , ඉන්නල - සන්ධි)

(v) **<u>ගුරුතුමා</u>** දුන් **<u>ගුරුඋපදේශ</u>** **<u>යළි</u>** සිහිකළ යුතු ය.
(ගුරුතුමා - සන්ධි , ගුරුඋපදේශ - සන්ධි , යළි - නිපාත)

(ල. 3×5=15)

06. අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) හෙළ විරු ..... උළෙල හෙට දින පැවැත්වේ.

(ii) නිදහස් අධ්‍යාපනයේ පියා ..... අප කාගේත් යුතුකමකි.

(iii) දේශ ..... සම්මානය ඔවුහු හිමිකර ගත්හ.

(iv) රටක සදාචාරත්මක දියුණුව උදෙසා කාන්තාව කාර්යභාරයක් ඉටු කරන්නී ය.

(v) ශ්‍රී රාහුල හිමියන්ගේ ..... ශක්තිය පුදුමාකාර ය.

(vi) පරිසර සංරක්ෂණය පොදු ජනතාව ඉටු කළ යුතු ..... කටයුත්තකි.

(අභිමාන , ස්මරණ , මහාර්ඝ , අබිමන් , සැමරීම, මහඟු) (ල. 1/2×6=3)

ආ) පහත දක්වා ඇති පද විසන්ධි කර ලියන්න.

i දෙයාකාර	ii සන්නස්	iii ඇද්දළ
iv කොස්සැට	v ළිං පඩිය	vi දිනිසුරු

(ල. 1/2×6=3)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ඉ) **තදකළු** අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **<u>මව්නි</u>** **<u>බුදුන්පුදට</u>** පැමිණෙන්න.

(ii) **<u>ඇගේ</u>** වරලස **<u>දිගට</u>** දිගේ බැබලෙයි.

(iii) **<u>රජුගේ</u>** පිරිස් **<u>කන්දෙන්</u>** එහා බලය පැතුරුහ. (ල. 1/2×6=3)

ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

අයියා දැන් කීවානේ මගෙ මිනිහා දන්නවයි කියල ඉතින් මට කීවට ඇති වැරැද්ද මොකක්ද එයා දැන් මෙහෙ ඉන්නවා ද එයාට මොකද උනේ දවස් ගානක් තිස්සේ මං මෙහෙට ආවේ මේක දැනගන්ඩ

(ල. 1/2×6=3)

උ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) මම අද මාගේ අවසාන විභාග ප්‍රශ්න පත්‍රය ලියමි' යි අමල් කීවේ ය.

(ii) ''අපි තරගය ජය ගනිමු'' යි ක්‍රීඩකයෝ කීහ.

(iii) ''මම 2026 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට ලියමි'' යි සුනේත්‍රා කීවා ය.

(ල. 1×3=3)

07.පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අඳුරෙක පෙර නිමිති දැක දුකින් බරව ගිය හදවතින් යුතු ව ගුත්තිල ඇඳුරුතුමාණෝ රජ **වාසලින්** නික්ම යති. තමා ලැබ සිටි අපිරිමිත **කීර්තිය** තමාගේ ම ශිෂ්‍යයා හා තරගයෙක යෙදීමෙන් රැක ගැනීමට ඔහුට සිදු ව ඇත. ඉක්බිති ව කියැවෙනුයේ අපේ **සාහිත්‍යයෙහි** ඇති අනුස්මරණීයතම පද්‍යයන්ගෙන් කිහිපයකි. එහි දී විරිත වෙනස් ව නැත. එහෙත් ගෙතුණු විදියේ කතානුරූප පද්‍යයෝ ම තව තවදුරටත් ගෙතෙති. පද යෙදුම් සුහුරු ය. කටවහරට පවා හුරු ය. යෙදී ඇති පද ඉතාම ලිහිල් ය. එතෙකුදු වුවත් කිසියම් සියුම් විදියෙකින් කළ ස්වර ගැළපීම්, කෙටි තියුණු **ඒකාක්ෂර** ශබ්ද, අසාමාන්‍ය එළිවැට යන මේ සියල්ලේ **සංකලනයන්** ගුත්තිල ඇඳුරු තුළ පහළ වූ වේදනාව, කෝපය, **ශූන්‍යතාව** තමාට කෙරුණු අයුක්තියක් පිළිබඳ හැඟීම, අපේක්ෂාභංගත්වය යන මෙකී නනාවිධ මනෝභාවයන් පාඨකයා ඉදිරියෙහි **නිරූපණය** කිරීමට කවිය සමත් වී ඇත.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන ආකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) වාග්වේදීන්, සාම්ප්‍රදායික, සීමාවක දී යන වචනවල අතුළත් පිලි වෙන වෙනම ලියන්න.

(iii) මෙම ඡේදයෙහි ඇතුළත් තද්ධිත පද තුනක් උපුටා දක්වන්න.

(iv) කතානුරූප, ඒකාක්ෂර, සංකලනයෙන් යන පද විසන්ධි කරන්න.

(v) මෙම ඡේදයෙහි ඇතුළත් අනුස්වාරය, කණ්ඨජ අඝෝෂ අල්පප්‍රාණාක්ෂරයක් සහ අර්ධ ස්වරයක් අන්තර්ගත වචනයක් උපුටා දක්වන්න.

(ල. 3×5=15)

08.පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මහාප්‍රාණ අක්ෂර

(ii) මිශ්‍ර ක්‍රියාව

(iii) ගෞරවාර්ථයේ තද්ධිත

(iv) පරස්වර ලෝප සන්ධිය

(v) විශේෂණ සමාසය

(ල. 3×5=15)

SLGURU.LK

For Educational Purpose Only

“The only person who is educated is the one who has learned how to learn and change.” — Carl Rogers

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.